(18)

MSVRI/VT9/37 2026.03.

අමාත්‍යාංශ චක්‍රලේඛ: 01/2026

උපකුලපති, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
උපකුලපති, සාගර විශ්වවිද්‍යාලය
සභාපති, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ/ විදුහල්පති, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

"නිපුණතා සිසු සවිය" ශිෂ්‍යාධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීම

2026 අයවැය යෝජනා යටතේ "නිපුණතා සිසු සවිය" ශිෂ්‍යාධාරය රු.7500 දක්වා ඉහළ නැංවීම හා අනෙකුත් වර්තමාන අවශ්‍යතා සැළකිල්ලට ගෙන "නිපුණතා සිසු සවිය" ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මැයෙන් නිකුත් කර ඇති 2025.04.25 දිනැති අමාත්‍යාංශ චක්‍රලේඛ 01/2024 (I) මගින් සංශෝධිත 2024.04.04 දිනැති අමාත්‍යාංශ චක්‍රලේඛ 01/2024 අවලංගු කරමින් 2026 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

02. ආර්ථිකමය අපහසුතා මත පාඨමාලා අවසන් කිරීමට පෙර පාඨමාලා හැර යන සිසුන් සංඛ්‍යාව අවම කරමින් වෘත්තීය අධ්‍යාපනයට ප්‍රවේශවන සිසුන්ගේ දෛනික වියදම් අවශ්‍යතාව පියවා ගැනීම සඳහා සහාය වීමටත්, කුසලතාවයන් නොමැතිවීම මත රැකියා විරහිතව සිටින තරුණ ප්‍රජාව වෘත්තීය අධ්‍යාපනය වෙත නැඹුරු කිරීමටත් මෙම ශිෂ්‍යාධාර ක්‍රමය ක්‍රියාත්මක කෙරේ.

03. ශිෂ්‍යාධාරලාභීන් තෝරා ගැනීම.

3.1 පහත සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන සිසුන් නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ ශිෂ්‍යාධාර ලබාදීම සඳහා තෝරා ගත යුතු ය.

3.1.1 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ පවතින, ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන මඟින් නඩත්තු වන කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී සිටින සිසුවෙකු වීම.

3.1.2 දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළ ඉල්ලුම මත පදනම්ව වැඩි ඉල්ලුමක් ඇති තාක්ෂණික පාඨමාලාවක ලියාපදිංචි වී ඇති සිසුවෙකු වීම.

3.1.3 දෙමාපියන්ගේ හෝ භාරකරුගේ වාර්ෂික ආදායම රු. 500,000/- හෝ ඊට වඩා අඩු ආදායමක් සහිත සිසුවෙකු බවට ස්ථිර පදිංචි ලිපිනය අයත් වසමේ ග්‍රාම නිලධාරී විසින් තහවුරු කර තිබීම.

3.1.4 පාඨමාලා කාලය මාස 6 ක් හෝ ඊට වැඩි කාල සීමාවක් සහිත ජාතික වෘත්තීය සුදුසුකම 7 මට්ටම (NVQ Level 7) දක්වා වන පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින සිසුවෙකු වීම.

(අ). එසේ වුවද, ජාතික වෘත්තීය සුදුසුකම් නොසලකා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළ ඉල්ලුම් මත පදනම්ව වැඩි ඉල්ලුමක් ඇති තාක්ෂණික පාඨමාලාවක ලියාපදිංචි වී ඇති ආධුනිකත්ව පුහුණුව ලබන සිසුවෙකු මෙම ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ ශිෂ්‍යාධාර ලැබීමට හිමිකම් ලබනු ඇත.

(ආ). තවද, පාඨමාලා කාලය මාස 6 ක් හෝ ඊට වැඩි කුමන හෝ පාඨමාලාවක ලියාපදිංචි වී සිටින විශේෂ අවශ්‍යතා සහිත සිසුන් දෙමාපියන්ගේ/ භාරකරුගේ වාර්ෂික ආදායම රු.500,000/- සීමාව නොසලකා ශිෂ්‍යාධාර සඳහා හිමිකම් ලබනු ඇත.

3.2 පහත සඳහන් සිසුන් මෙම යෝජනා ක්‍රමය යටතේ ශිෂ්‍යාධාර ලබා දීම සඳහා හිමිකම් නොලබනු ඇත.

3.2.1 කර්මාන්තගත (On the Job Training - OJT) පුහුණුව ලබන සිසුන්

("වෘත්තීය අධ්‍යාපන හා පුහුණු (TVET) ආයතනවල ලියාපදිංචි වී සිටින පුහුණුලාභීන්ගේ ප්‍රායෝගික පුහුණුව, ඵලදායී කාර්යයන් සහ වෘත්තීය සංවර්ධනයේ කොටසක් ලෙස අදාළ උපදේශකයින් මෙහෙයවනු ලබන, එසේත් නැතිනම් කාර්මික සංවිධාන/ව්‍යවසායයන්හි සේවය කරන සේවකයින් සඳහා අදාළ පුහුණුකරුවන් සහ ප්‍රථම පෙළ අධීක්ෂකයින් විසින් මෙහෙයවනු ලබන, සේවා ස්ථානය තුළ හෝ එම පරිශ්‍රය තුළම සිදුකරනු ලබන පුහුණුව OJT පුහුණුව" ලෙස අර්ථ දක්වා ඇත)

3.2.2 අර්ධ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වන සිසුන්

04. පාඨමාලා තෝරා ගැනීම

4.1 ඉහත 03 ඡේදය යටතේ දක්වා ඇති නිර්ණායක සැලකිල්ලට ගෙන ශිෂ්‍යාධාර ගෙවීම සඳහා එක් එක් වෘත්තීය පුහුණු ආයතන මට්ටමින් හඳුනාගනු ලැබූ පාඨමාලා ලැයිස්තුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහ පාඨමාලා තෝරා ගැනීමේ කමිටුවේ නිර්දේශ අනුව ඇමුණුම 01 ලෙස මෙයට යා කොට ඇත.

4.2 ශිෂ්‍යාධාර ගෙවීම සඳහා කාලානුරූපීව පාඨමාලා තෝරා ගැනීම පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත ස්ථාවර කමිටුවක් මඟින් නිශ්චය කරනු ඇත.

i. අමාත්‍යාංශයේ වෘත්තීය පුහුණු විෂය භාර අතිරේක ලේකම්
ii. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ නියෝජිතයෙකු
iii. වෘත්තීය පුහුණු ආයතන ප්‍රධානීන් හෝ නියෝජිතයකු

4.3 ජාතික වෘත්තීය සුදුසුකම සහිත (NVQ) පාඨමාලාවක් ආරම්භයේදී පවත්වනු ලබන ප්‍රවේශක පුහුණුව/හඳුන්වාදීමේ පුහුණුව (Induction Training), පාඨමාලාවේ ඉගෙනුම්කාරීත්වය වැඩිදියුණු කරන අමතර විෂය පුහුණුව හා විෂය මාලාවේ සඳහන් කාලය පදනම් කර ගනිමින්, එක් එක් පාඨමාලාව සඳහා ගෙවීම් සිදු කරන කාලසීමාව පාඨමාලා තෝරාගැනීමේ කමිටුව විසින් නිර්ණය කළ යුතුය.

05. ශිෂ්‍යාධාර ගෙවීම

5.1 එක් සිසුවකු සඳහා උපරිම මාසික ශිෂ්‍යාධාරය රු.7500/- කි.

5.2 පාඨමාලාවට නියමිත මාසික අධ්‍යයන පැය ගණනින් 90 % ක් හෝ ඊට වැඩි පැය ගණනක් පාඨමාලාව සඳහා සහභාගීවී ඇති බව පැමිණීමේ ලේඛන අනුව අධිකාරිය ලත් බලධරයා සහතික කරන්නේ නම්, එවන් සිසුවකු රු.7500/- වන සම්පූර්ණ ශිෂ්‍යාධාරය ලැබීමට සුදුසුකම් ලබයි.

5.3 මාසික පැමිණීමේ පැය ගණන, පාඨමාලාව සඳහා නියමිත මාසික අධ්‍යයන පැය ගණනින් 75% - 89% අතර නම් (75% හා 89% ඇතුළත්ව) එවන් සිසුවෙකු රු. 6000/- ශිෂ්‍යාධාරයක් ලැබීමට සුදුසුකම් ලබන අතර, 75% ට අඩු මාසික පැමිණීමේ පැය ගණනක් සහිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර හිමි නොවේ.

5.4 පාඨමාලාවේ ඇගයීම්වලදී අපේක්ෂිත කාර්ය සාධනයට ළඟා නොවන හා ආයතනයේ පවත්වාගෙන යා යුතු ශිෂ්‍ය විනය සම්බන්ධයෙන් දඬුවම් ලබන සිසුන්ට ශිෂ්‍යාධාර ලබා දීම නතර කිරීමට කටයුතු කළ යුතු වේ.

5.5 පාඨමාලාව සඳහා ශිෂ්‍යයාගේ කැපවීම, ශිෂ්‍ය කාර්ය සාධනය, පාඨමාලා අතරමගදී අතහැර යාම අවම කිරීම, ශිෂ්‍ය අභිප්‍රේරණය ඇති කිරීම සඳහා මාසිකව ලබා දෙනු ලබන ශිෂ්‍යාධාර ගණන පහත පරිදි පාඨමාලාවේ කාලය පදනම් කරගෙන තීරණය වේ.

පාඨමාලා කාලය (මාස)	6	12	18	24	30	36	42	48
ශිෂ්‍යාධාර ලබා දෙන උපරිම මාස ගණන	5	10	15	20	25	30	35	40

5.5.1 වැඩි පුහුණුලාභීන් සංඛ්‍යාවකට අවස්ථාව ලබා දීම පිණිස ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය යටතේ ආධුනිකත්ව පුහුණුව ලබන සිසුවෙකු සඳහා ශිෂ්‍යාධාර ලබා දීමේදී උපරිම මාස 6ක පුහුණු කාලසීමාවක් සලකා බලන අතර, ඒ අනුව එවන් සිසුවෙකුට ශිෂ්‍යාධාරය ලබා ගත හැකි උපරිම කාලසීමාව මාස 05 කි.

5.6 නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ ශිෂ්‍යාධාර ලැබීමට හිමිකම් ලබන සිසුවෙකු දැනටමත් රජයේ වියදමින් යම් ශිෂ්‍යාධාරයක්/ දීමනාවක් ලබන්නේ නම් එහිදී එම සිසුවා වඩාත් වාසිදායක දීමනාව පමණක් ලබා ගැනීමට හිමිකම් ලබනු ඇත.

5.7 අමාත්‍යාංශය මඟින් සපයනු ලබන ආකෘතිපත්‍ර පදනම් කර ගනිමින් ශිෂ්‍යාධාර ලැබීම සඳහා තෝරා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ කරුණු ඇතුළත් වාර්තාවක් සෑම කාර්තුවක් ආරම්භයේම සහතික කර ප්‍රතිපාදන සඳහා ඉල්ලීමක් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු) වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ අනුව, අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් අදාළ ආයතන වෙත ප්‍රතිපාදන වෙන් කරනු ඇත.

5.8 ශිෂ්‍යාධාර ගෙවීම සිසුන්ගේ පෞද්ගලික බැංකු ගිණුමකට මුදල් බැර කිරීමෙන් පමණක් සිදු කළ යුතු අතර මාසිකව අදාළ ශිෂ්‍යාධාරය ලබා ගත් බවට තහවුරුවක් ලබා ගැනීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

CamScanner

5.9 මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ ඉගැන්වීම් කටයුතු සිදු කිරීමේදී හා ඊට අදාළ ප්‍රායෝගික පුහුණුව සඳහා ආයතනය වෙත පැමිණීමේදී මෙන්ම මිශ්‍ර ඉගැන්වීම් ක්‍රමය (Blended Learning) අනුව ඉගැන්වීම් කටයුතු සිදු කිරීමේදී මෙහි 5.2 හා 5.3 වගන්ති ප්‍රකාරව ශිෂ්‍ය සහභාගිත්වය පදනම් කර ගනිමින් මාසිකව ගෙවීම් සිදු කළ යුතු ය.

5.10 චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව ශිෂ්‍යාධාරලාභීන් තෝරාගැනීම හා ශිෂ්‍යාධාර ගෙවීම් කිරීමේ වගකීම ආයතන ප්‍රධානියා වෙත පැවරෙන අතර පවත්නා මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් අනුකූලව සියලු ගෙවීම් සිදු කළ යුතු වේ. ඒ අනුව, ආයතන ප්‍රධානීන් විසින් සුදුසුකම් ලැබූ සිසුන් සඳහා නිසිකලට නියමිත පරිදි ගෙවීම් සිදුවන බවට සහතික කර ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන යා යුතු අතර අදාළ ගෙවීම් තහවුරු කිරීම සඳහා විධිමත් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

06. මාසික වියදම් වාර්තාව

6.1 අමාත්‍යාංශය මඟින් සපයනු ලබන ආකෘතිය පදනම් කර ගනිමින් අදාළ මාසයේ වියදම් වාර්තාව ඵළඹෙන මස 15 වන දිනට ප්‍රථම ආයතන ප්‍රධානියා විසින් සහතික කර ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත පිටපතක් සහිතව අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු) වෙත යොමු කළ යුතු ය.

07. වෙනත්

7.1 නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාරය පිළිබඳ වෘත්තීය පුහුණු ආයතන විසින් සිය ආයතනවල පවතින වෘත්තීය මාර්ගෝපදේශ අංශය, ආයතන වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ඔස්සේ සිසුන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

7.2 මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳ යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම්, වෘත්තීය අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු) වෙත ඉදිරිපත් කර ලිඛිත පැහැදිලි කිරීමක් ලබාගත යුතුය.

මෙහි සඳහන් විධිවිධාන 2026 ජනවාරි 01 දින සිට බලාත්මක වන අතර, අදාළ ආයතන ප්‍රධානීන් විසින් මෙකී විධිවිධාන ප්‍රකාරව තම ආයතනවල වෘත්තීය අධ්‍යාපනය ලබන සිසුන් සඳහා මෙම ශිෂ්‍යාධාර ලබා දීමට කටයුතු කළ යුතු වේ.

නාලක කලුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

o/c

පිටපත්:

1. ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
2. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

CamScanner